# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 9 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය කාලය :

1) ඇමරිකා එක්සත් ජනපදයේ පැවති වහල්භාවය ඉවත් කිරීමට කටයුතු කළ පුද්ගලයා වන්නේ,
   i) ඇරිස්ටෝටල්
   ii) ඒබ්‍රහම් ලින්කන්
   iii) මාහාචාර්ය ගානර්
   iv) ජී. ඩී. එච්. කෝල්

2) සමාජ සුරක්ෂිතතාවය සඳහා පවුලකින් ඉටුවිය යුතු කාර්යයන් මොනවාද?
   i) ආදර්ශයෙන් මඟ පෙන්වීම.
   ii) චිත්තවේග පාලනයට හුරු කිරීම.
   iii) දැරිය හැකි අල්පේච්ඡ ජීවන රටාවකට හුරු කිරීම.
   iv) විනය හා ශික්ෂණය ඇති කිරීම.

3) නීතියේ ගුණාංගයක් නොවන්නේ,
   i) මිනිසාගේ බාහිර ක්‍රියාකාරකම් හා හැසිරීම් පාලනය නොකිරීම.
   ii) සැමට සාධාරණව හා සමානව ක්‍රියාත්මක කිරීම.
   iii) නිරවුල්ව හා පැහැදිලිව දැක්විය යුතු වීම.
   iv) නීති කඩ කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වීම.

4) පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩාමක් හෝ සමාජයට එරෙහිව කරනු ලබන වැරදි සම්බන්ධයෙන් බලපාන නීති අයත් වන්නේ කුමන නීති වර්ගයටද?
   i) සිවිල් නීති ගණයට
   ii) අපරාධ නීති ගණයට
   iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නීති ගණයට
   iv) අන්තර් ජාතික නීති ගණයට

5) සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩනැගීම දැක්ම ලෙස භාවිතා කරන්නේ,
   i) බන්ධනාගාර දෙපාර්තමේන්තුව
   ii) ශ්‍රී ලංකා නාවික හමුදාව
   iii) සමථ මණ්ඩලය
   iv) රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

6) 'සුරකිමු ලකඹර' ආදර්ශ පාඨය භාවිතා කරන්නේ,
   i) ශ්‍රී ලංකා යුධ හමුදාව
   ii) ශ්‍රී ලංකා ගුවන් හමුදාව
   iii) ශ්‍රී ලංකා නාවික හමුදාව
   iv) ශ්‍රී ලංකා පොලීසිය

7) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා ඇත්තේ,
   i) 1966 අංක 45 දරණ පනත මඟින්
   ii) 1966 අංක 40 දරණ පනත මඟින්
   iii) 1998 අංක 50 දරණ පනත මඟින්
   iv) 1998 අංක 45 දරණ පනත මඟින්

8) 'අලුත් අලුත් දෑ නොතකන ජාතිය ලොව නොනගී' කියමන ඉදිරිපත් කළේ,
   i) මාර්ටින් වික්‍රමසිංහ මහතා
   ii) ඩබ්. ඩී. අමරදේව මහතා
   iii) සුනිත් ආරියරත්න මහතා
   iv) කුමාරතුංග මහතා

9) කාර්මික අංශයේ දියුණුවත් සමඟ එකලස් කිරීමේ කර්මාන්ත විශාල වශයෙන් බිහි වී තිබේ. පහත පිළිතුරු අතරින් එකලස් කිරීමේ කර්මාන්තයක් නොවන්නේ,
   i) විද්‍යුත් කර්මාන්ත
   ii) නැව් තැනීමේ කර්මාන්ත
   iii) කපු පිළි කර්මාන්ත
   iv) මෝටර් රථ නිෂ්පාදනය කර්මාන්ත

10) ආර්ථිකයේ සිදුවන විවිධ වෙනස්වීම් පුද්ගලයා හා සමාජය කෙරෙහි ඇති කරන බලපෑමක් නොවන්නේ,
   i) වැරදි චර්යාවන්ට හුරු වීම
   ii) නාගරීකරණය වීම
   iii) පරිසර දූෂණය පාලනය වීම
   iv) මානසික ආතතිය වැඩි වීම

11) යහජීවන ගුණාංග පුරුදු පුහුණු නොවීමෙන් අත්වන අයහපත් ප්‍රතිවිපාකයක් වන්නේ,
   i) අන්තර් පුද්ගල සබඳතා වර්ධනය වීම
   ii) ස්වභාවික සම්පත් ආරක්ෂා වීම
   iii) ආතතිය වැඩි වීම
   iv) අල්ලසට හා දූෂණයට යොමු නොවීම

12) වර්තමාන සමාජය තුළ සහජීවනය පැවතිය යුත්තේ,
   i) සමාජ සුරක්ෂිත බව තහවුරු කිරීමට
   ii) විවිධත්වයෙන් යුතු සමාජයේ එකමුතුකම රැක ගැනීමට
   iii) තම අවශ්‍යතා ඉටු කර ගත නොහැකි අයට උපකාර කිරීමට
   iv) අධර්මිෂ්ඨ සමාජයක් ගොඩනැඟීමට

13) ධාර්මික ක්‍රම වලින් ධනය උපයා ගනිමින් අසල්වැසියන් සමඟ දුක සැප බෙදා ගැනීමට මඳ වශයෙන් හවුල් වන පිරිස් අයත් වන්නේ මෙම කුමන වර්ගීකරණයටද?
   i) සහජීවන ගුණාංග වැඩි නමුත් යහජීවන ගුණාංග අවම පුද්ගලයන් ය.
   ii) සහජීවන ගුණාංග අඩු නමුත් යහජීවන ගුණාංග වැඩිපුද්ගලයන් ය.
   iii) සහජීවන ගුණාංග මෙන්ම යහජීවන ගුණාංග ද අවම පුද්ගලයන් ය.
   iv) සහජීවන ගුණාංග හා යහජීවන ගුණාංග උපරිම පුද්ගලයන් ය.

14) ශ්‍රී ලංකාවට ආවේණික දේශීය ඖෂධයක් නොවන්නේ,
   i) කොතල හිඹුටු
   ii) පුස්වැල්
   iii) කොත්තමල්ලි
   iv) වෙනිවැල්

15) 'මකරා' මුල් කරගත් සංස්කෘතිකාංග රැසක් ඉදිරිපත් කරන රටක් වන්නේ,
   i) ඉන්දියාව
   ii) කොරියාව
   iii) චීනය
   iv) මැලේසියාව

16) 'ප්‍රජාතන්ත්‍රවාදය යනු මහජනයා විසින් මහජනයා උදෙසා ක්‍රියාත්මක කරනු ලබන මහජන පාලන ක්‍රමයකි.' මෙම නිර්වචනය ඉදිරිපත් කළේ,
   i) සීලර්
   ii) ඒබ්‍රහම් ලින්කන්
   iii) ඇරිස්ටෝටල්
   iv) ගානර්

17) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණයක් නොවන්නේ,
   i) නිදහස් ජනමාධ්‍ය පැවතීම
   ii) රට ඡන්ද කොට්ඨාස වලට බෙදා තිබීම
   iii) ඒක පක්ෂ ක්‍රමයක් පැවතීම
   iv) සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක වීම

18) පුරවැසියෙකු විසින් ඉටු කළ යුතු මූලික යුතුකම් දක්වා ඇත්තේ,
   i) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි ව්‍යවස්ථාවෙන්
   ii) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වැනි ව්‍යවස්ථාවෙන්
   iii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි ව්‍යවස්ථාවෙන්
   iv) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වැනි ව්‍යවස්ථාවෙන්

19) එක් එක් ප්‍රදේශවල ප්‍රාදේශීය අවශ්‍යතා විවිධ වීමට බලපාන හේතුවක් නොවන්නේ,
   i) සම්පත් වල ව්‍යාප්තිය
   ii) ආර්ථික වර්ධනය
   iii) සංස්කෘතික විවිධත්වය
   iv) භූගෝලීය පසුබිම

20) පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීමේදී සැලකිල්ලට ගනු ලබන නිර්ණායකයක් නොවන්නේ,
   i) ආර්ථික සංවර්ධන මට්ටම
   ii) ජනගහනය හා ජන ඝනත්වය
   iii) ජන වාර්ගික ජනගහන අනුපාතය
   iv) ඒක පුද්ගල අනුපාතය

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**

1)

i) සමාජ සුරක්ෂිතතාවය සඳහා බලපාන ආයතන 2ක් ලියන්න.

ii) නීතියේ මූලාශ්‍ර 2ක් ලියන්න.

iii) අධිකරණය සම්බන්ධ පුද්ගල වගකීම් හා යුතුකම් 2ක් ලියන්න.

iv) තාක්ෂණය වෙනස්වීමත් සමඟ සමාජය තුළ ඇති වූ නව වෙනස්කම් 2ක් ලියන්න.

v) තිරසර සංවර්ධනය යනු කුමක්ද?

vi) ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලි 2ක් ලියා දක්වන්න.

vii) වත්මන් රැකියා වෙළඳපොළ බෙදා දක්වන ප්‍රධාන අංශ 2 දක්වන්න.

viii) සහජීවන ගුණාංග 2ක් ලියා දක්වන්න.

ix) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමූපකාර සමිති වර්ග 2ක් ලියන්න.

x) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල් 2ක් ලියන්න.

2)

i) සමාජ සුරක්ෂිතතාවය කෙරෙහි ආගමික ආයතනවලින් කරන දායකත්වයන් 2ක් ලියන්න.

ii) සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වන සමාජ ආයතන 3ක් ලියන්න.

iii) නීතියේ ගුණාංග 3ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

3)

i) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව බෙදෙන ප්‍රධාන වර්ග 2 ලියන්න.

ii) අන්තර්ජාතික වශයෙන් බලපවත්නා නීති 3ක් ලියන්න.

iii) නීතිය බලාත්මක කිරීම සඳහා පවතින ආයතන 3ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

4)

i) ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලි 2ක් ලියන්න.

ii) යහජීවන ගුණාංග 3ක් ලියන්න.

iii) සහජීවන ගුණාංග තම ජීවිතයට අදාළ කර ගැනීමෙන් අත්වන ප්‍රතිලාභ 3ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

5)

i) ප්‍රජාතන්ත්‍රවාදය බෙදෙන ප්‍රධාන කොටස් 2 ලියන්න.

ii) ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයට සහභාගීවීමට අවස්ථාව හිමි නොවූ පාර්ශව 3ක් ලියන්න.

iii) දේශපාලන පක්ෂයකින් ඉටුවිය යුතු කාර්යයන් 3ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

6)

i) 1987 න් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 2ක් ලියන්න.

ii) පළාත් පාලන ආයතනයක ප්‍රධානියා සතු බලතල 3ක් ලියන්න.

iii) ජාතික සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතන විසින් අවධානය යොමු කළ යුතු කරුණු 3ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.